මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **LAE/2025/99**

**2025.05.08**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025 මැයි 06

## 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ විධිවිධාන

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා තරග කළ සියලුම අපේක්ෂකයන්, අපේක්ෂකයන් නියෝජනය කරන ලද දේශපාලන පක්ෂවල ලේකම්වරුන් සහ ස්වාධීන කණ්ඩායම් නායකයන්, 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ප්‍රකාරව තම මැතිවරණ ප්‍රචාරණ ආදායම් වියදම් වාර්තා වෙන වෙනම සකස් කර 2025.05.27 වන දින මධ්‍යම රාත්‍රී 12:00 ට හෝ ඊට ප්‍රථම ඒ ඒ අපේක්ෂකයින්, දේශපාලන පක්ෂ ලේකම්වරුන් හා ස්වාධීන කණ්ඩායම් නායකයින් විසින් තරග කරන ලද පළාත් පාලන ආයතනවල තේරීම්භාර නිලධාරීන් වෙත භාර දිය යුතු වේ.

එසේම එම අපේක්ෂකයින්ට, අපේක්ෂකයන් නියෝජනය කරන ලද දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට, ස්වාධීන කණ්ඩායම් නායකයන්ට මැතිවරණ ප්‍රචාරණ ආදායම් වියදම් වාර්තා භාරදීමට හැකිවන පරිදි, සාමාන්‍ය රාජකාරී දිනවල ප.ව. 6:00 දක්වා හා 2025.05.27 වන දින මධ්‍යම රාත්‍රී 12:00 දක්වා සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල මැතිවරණ ආදායම් වියදම් වාර්තා භාරගැනීමේ විශේෂ ඒකක විවෘතව තැබීමට කටයුතු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

තවද, 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 8(අ) වගන්තිය ප්‍රකාරව, 2025.05.27 වන දින මධ්‍යම රාත්‍රී 12:00 ට හෝ ඊට ප්‍රථම මැතිවරණ වියදම් වාර්තා භාර නොදීම තුළින් නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සිදු කරන අතර ඒ පිළිබඳව මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතට අනුකූලව නීත්‍යානුකූලව කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

**ආර්.එම්.ඒ.එල්. රත්නායක**
සභාපති , මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)